# ත්‍රිපිටකයෙන් හෙළිවන ආරාමික ස්වස්ථතාවට අදාළ වාස්තු විද්‍යාත්මක අංග හා ඒවා ශ්‍රී ලංකාවේ මුල්කාලයේ දී භාවිත කළ ආකාරය

**ආර්. ඩී. ශ්‍රියානි හේමලතා**

(ගෞරව ශාස්ත්‍රවේදී බෞද්ධ ශිෂ්ටාචාරය B.A, බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ඩිප්ලෝමා, ශාස්ත්‍රපති M.A, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ඩිප්ලෝමා)

පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, කැලණිය විශ්වවිද්‍යාලය, rd.sriyani@yahoo.com

## හැඳින්වීම

ස්වස්ථ යන ත්‍රිලිංගික නාමයට තා ප්‍රත්‍ය එකතු වීමෙන් සෑදෙන ස්වස්ථතා යන්නට ආරෝග්‍ය, ශරීරසුව, සනීපය, නිරෝගිකම යන වචන පර්යාය නාම ලෙස ව්‍යවහාර වේ. බුදුදහම පුද්ගලයාගේ මානසික මෙන්ම කායික ස්වස්ථතාව පිළිබඳ ව අවධානය යොමුකර ඇත. චතුරාර්ය සත්‍ය පිළිබඳ ව විස්තර කරන තැන දුක්ඛ සත්‍ය රෝගයක් ලෙස ද සමුදය සත්‍ය රෝග නිදානය ලෙස ද නිරෝධ සත්‍ය රෝග සංසිඳවීම ලෙස ද මාර්ග සත්‍ය බෙහෙත් ලෙස ද දක්වා ඇත. කායික ස්වස්ථතාව මානසික ස්වස්ථතාව කෙරෙහි බලපායි. භික්ෂූන් වහන්සේලාගේ කායික ස්වස්ථතාවට අදාළ ඉගැන්වීම් රාශියක් විනය පිටකයේ අන්තර්ගත වේ. ''ආරෝග්‍යපරමා ලාභා-සන්තුට්ඨීපරමං ධනං'' යන තැන පරම ලාභය ලෙස දක්වා ඇත්තේ නිරෝගි බවයි (ඛුද්දක නිකාය 2005:76). පුද්ගලයෙකුට වැළඳිය හැකි රෝග පිළිබඳ දීර්ඝ විස්තරයක් ගිරිමානන්ද සූත්‍රයෙන් හෙළිකරගත හැකිය. හිසරුදාවකින් පීඩාවට පත්ව සිටි පිලින්දවච්ඡ තෙරුන් වහන්සේගේ එම රෝගය සුවකළේ නැහැඹරුවෙහි බහාලීමෙනි. භික්ෂූන් වහන්සේලාගේ දොස් කිපුණුවිට විරේචනයක් ගත්තේ ද කැඳවතුර වැළඳුවේ ද උක්සකුරු ගිතෙල්, තලතෙල්, මීපැණි ආදිය ආහාරයට යොදාගත්තේ ද ඊට අනුමතිය ලද බැවිනි. ඇතැම් රෝගීන්ට ප්‍රතිකාර කිරීමේදී බෙහෙත් ගලගා අඹරා ගන්නට සිදුවිය. එම ඖෂධ අසුරා තැබීමට ලොහොසැළිය, ලීසැළිය ආදි ඇසුරුම් බඳුන් භාවිත කරන ලදී. ''අනුජානාමි භික්ඛවේ සත්ථකම්ම'' යනුවෙන් සැත්කම් කිරීම ද අනුමත කළ අතර එක් භික්ෂුවකගේ ගණ්ඩාබාධයක් සුවකළේ උන්වහන්සේ සැත්කමකට ලක්කිරීමෙනි. ඒ සඳහා භාවිත කරන ලද උපකරණ පිළිබඳ ව විනය පිටකයෙන් තොරතුරු සොයාගැනීමට නොහැකි වුවද නැහැඹරුව, ලොහොසැළිය, ලීසැළිය ආදි උපකරණ පිළිබඳ ව තොරතුරු රාශියක් අඩංගු වේ. ඊට අමතරව අමනුෂ්‍යයන් නිසා හටගන්නා රෝග හා ඒවාට යොදන ලද ප්‍රතිකාර ක්‍රම පිළිබඳ ව විනය පිටකයේ කරුණු අන්තර්ගතය.

මේ අනුව ආරාමික ස්වස්ථතාවට අදාළ කරුණු රාශියක් විනය පිටකයේ චුල්ලවග්ගපාළි ඛුද්දකවත්ථුක්ඛන්ධකය, සේනාසනක්ඛන්ධකය, ජන්තාඝරවත, මහාවග්ගපාළි උපෝසථක්ඛන්ධකය, භේසජ්ජක්ඛන්ධකය මෙන්ම සූත්‍ර පිටකයේ අංගුත්තර නිකාය නගරූපම සූත්‍රය, අංගුත්තර නිකාය ගිරිමානන්ද සූත්‍රය, දීඝ නිකාය මහාසුදස්සන සූත්‍රය ආදි තැන්වලින් හෙළිකරගත හැකිය. ඒ අනුව ජන්තාඝරය, සක්මන්මළුව, මුළුතැන්ගෙය, වැසිකිළිය, කැසිකිළිය, ළිං හා පොකුණු ආදිය ආරාමික ස්වස්ථතාවට අදාළ වාස්තු විද්‍යාත්මක ඉදිකිරීම් වශයෙන් හඳුනාගත හැකිය.

භික්ෂූන් වහන්සේලාගේ ස්ථූල බව පාලනයකර ගැනීම සඳහා ජන්තාඝරය යොදා ගන්නා ලදී. ආරම්භක යුගයේ දී ඉදිකරන ලද ජන්තාඝරයේ වාකවුළු නොතිබිණි. එහෙත් ඡබ්බග්ගිය භික්ෂූන් වහන්සේලාගේ නොහික්මුණු ක්‍රියා හේතු කොටගෙන ඊට වාකවුළුවක් එකතු කිරීමට සිදුවිය. එසේම ජන්තාඝරය තුළ ක්‍රියාකළ යුතු වූයේ විනයානුකූලවය. එහි එක් පැත්තක ලිපක් පිළියෙළ කෙරුණි. ඒ තුළ විශාල ජල බඳුනක් විය. සිරුරෙහි ගල්වා

ගැනීමට බෙහෙත් හා මැටි ආදිය ද විය. ජන්තාඝරයෙහි කාර්ය නිමවීමෙන් පසුව අවසානයට එයින් පිටවන භික්ෂූන් ලිප ගිනි නිවා භාජන අදාළ ස්ථානවල තබා අළු ඉවත්කර යා යුතුය. ශ්‍රී ලංකාවේ මුල්කාලයේ ඉදිකරන ලද සෑම ජන්තාඝරයක් ම විනයෙහි සඳහන් මෙම ක්‍රමය අනුගමනය කර ඇති බව දැනට සොයාගෙන ඇති පුරාවිද්‍යාත්මක සාධකවලින් අනාවරණය වේ.

කායික මෙන්ම මානසික සුවය සඳහා සක්මන්මළුව වැදගත් අංගයකි. එය ඉදිකෙරුණේ උස්බිමකය. එබැවින් එයට ගොඩවීමට පියගැටපෙළක් ද අත්වැට ද තනන ලදී. සක්මන්මළුව භික්ෂූන් වහන්සේලා අතර ප්‍රචලිතවීමේදී ඊට සම්බන්ධ ව සක්මන්හලක් ද ඉදිකෙරිණි. ලංකාවේ රිටිගල, අරන්කැලේ, අනුරාධපුර බටහිරාරාම, ආදි ස්ථානවලින් මෙවැනි සක්මන්මළු සොයාගත හැකිය.

පරිසරයේ දුර්ගන්ධය වළක්වාගැනීම, භික්ෂූන් වහන්සේලාගේ කායික හා මානසික ස්වස්ථතාව ආරක්ෂාකර ගැනීම, විනය ආරක්ෂාකර ගැනීම යන කරුණු මුල්කරගෙන වැසිකිළි හා කැසිකිළි පිළිබඳ කරුණු විනය පිටකයේ ඉදිරිපත්කර ඇත. එයට අනුව ඉන්දියාවේ ආරාම ඉදිකළ මුල්කාලයේ වසුරුවල තනා ඇත්තේ ලී භාවිත කිරීමෙනි. වළක් කපා ඒ මත ලී අතුරා ලී දණ්ඩ මැද සිදුරු කොට ඒ දෙපස පාදුකා තනන ලදී. එසේ තනන ලද පාදුකා තැනින් තැනට ගෙනයාම අකැපය. ලංකාවේ මුල්කාලයේ ඉදිකරන ලද වැසිකිළි හා කැසිකිළි ශෛලමය නිර්මාණයන් බව පෙනේ. ඒවායෙහි පාදුකා විනය පිටකයේ දැක්වෙන ආකාරයට තැනින් තැන ගෙනයා නොහැකිය. පාදුකා දෙක අතර ආවාටයකි. එම ආවාටය තුළින් බැහැර කරන අපද්‍රව්‍ය ඊට පහළින් සකසන ලද වළකට ගෙනගිය බවට සාධක ලැබේ. මේ යුගයේ නිර්මාණය කරන ලද ඇතැම් වැසිකිළි හා කැසිකිළි ගල් ඉතා සරල ඒවා වන අතර ඇතැම් ඒවා සංකීර්ණ ස්වරූපයක් ගෙන තිබේ.

විනය පිටකයට අනුව වසුරුවළ වැසීම සඳහා පියනක් භාවිත කළ යුතුය. එවැනි අංගයක් ලංකාවේ මුල්කාලයේ වැසිකිළි හා කැසිකිළිවල භාවිත කළ බවක් නොපෙනේ. එසේම වැසිකිළි හා කැසිකිළිවල බිත්ති මාලාකර්ම, ලතාකර්ම ආදි චිත්‍රවලින් අලංකාර කිරීම විනයානුකූලය (චුල්ලවග්ගපාළි 2005:110). ලංකාවේ මුල්කාලයේ ඉදිකරන ලද වැසිකිළි හා කැසිකිළිවල පාදුකා ඇතුළු ශෛලමය පුවරුවේ එවැනි විමාන ආකාරයේ කැටයම් දැකගත හැකිය.

විනය පිටකයේ පිණ්ඩචාරිකවතට අනුව බුදුරජාණන් වහන්සේ ඇතුළු ශ්‍රාවකයන් වහන්සේලා ආරම්භයේ සිටම සිව්පස ලබාගත්තේ පිණ්ඩපාතයේ වැඩම කිරීමෙනි (චුල්ලවග්ගපාළි 2005:354). එහෙත් රජගහනුවර දුර්භික්ෂයක් ඇතිවූ අවස්ථාවක ආරාමයෙහි ආහාර පිසගැනීමේ අවශ්‍යතාව මතුවූයෙන් ආරාමය තුළ මුළුතැන්ගෙය ඉදිකිරීමට අවසර ලැබිණි (චුල්ලවග්ගපාළි 2005:554). ඒ අනුව මුළුතැන්ගෙය සෞඛ්‍යාරක්ෂිත ආරාමික වාස්තු විද්‍යා අංගයක් ලෙස භාවිතකරන ලද බව පෙනේ. ලංකාවේ මුල්කාලයේ සිටම භික්ෂූන් වහන්සේලාට දානය සැපයීම සඳහා මහාපාලි ආදි ස්ථාන පිහිටුවා ඇත. ඒ හැරුණු කොට ආරාමවල මුළුතැන්ගෙයක් තිබූ බව දැනට ලැබී ඇති ලිඛිත හා පුරාවිද්‍යාත්මක සාධක අනුව පැහැදිලි කරගත හැකිය.

ආරාමික ස්වස්ථතාවට අදාළ වාස්තු විද්‍යාත්මක අංග පිළිබඳ ව සාකච්ඡා කිරීමේදී පොකුණු හා ළිං පිළිබඳ ව විස්තර කළ යුතුය. විනය පිටකයට අනුව පොකුණු තැනීමේදී ඉවුර කඩාවැටීම වැළැක්වීමට ගඩොල්, ගල් හා දඬු ආදි ද්‍රව්‍ය යොදා බැම්මක් බැදිය යුතුය (චුල්ලවග්ගපාළි 2005:54). ලංකාවේ මුල්කාලයේ ඉදිකරන ලද සෑම ආරාමයකම පොකුණු හා ළිං දැකගත හැකිය. දේවානම්පියතිස්ස රජු විසින් කරවන ලද පොකුණු දෙකක් මගුල් උයනෙහි වේ. අභයගිරිය විහාරයේ භික්ෂූන් වහන්සේලා පරිහරණය කළ කුට්ටම් පොකුණ ලෝක ප්‍රකට වූවකි. මහාපාලි දාන ශාලාව අසල ද බටහිරාරාමයේ ද මෙවැනි පොකුණු හා ළිං දැකගත හැකිය. මේ සෑම අංගයක් ම විනය පිටකයේ පැනවීම්වලට අනුකූලව ඉදිකරන ලද අතර ලංකාවේ දී මෙම අංග ඉතා විසිතුරු ලෙස කරවා ඇති බව පෙනේ.

**පර්යේෂණයේ අරමුණ**

මෙම පර්යේෂණ පත්‍රිකාව ඉදිරිපත් කිරීමේ ප්‍රධාන අරමුණ වන්නේ ත්‍රිපිටකයෙන් හෙළිවන ආරාමික ස්වස්ථතාවට අදාළ

වාස්තු විද්‍යාත්මක අංග හඳුනාගැනීම හා ඒවා ශ්‍රී ලංකාවේ මුල්කාලයේ ආරාමවල කෙතෙක් දුරට භාවිතකර ඇත්ද යන්න පිළිබඳ ව සාකච්ඡා කිරීමය.

## අධ්‍යයන ක්‍රමවේදය

එහිදී මූලික වශයෙන් ථේරවාද ත්‍රිපිටකය (බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලාව) පරිශීලනය කළෙමි. එසේම ලංකාවේ අනුරාධපුර යුගයේ ආරාම ගොඩනැගිලි පිළිබඳ තොරතුරු සෙවීමේදී වංශකථා සාහිත්‍ය, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් ඊට සම්බන්ධව කරන ලද ගවේෂණ, කැනීම් හා සංරක්ෂණ වාර්තා මෙන්ම පාලන වාර්තා පිළිබඳ ව අධ්‍යයනය කරන්නටත් ක්ෂේත්‍ර අධ්‍යයනය කරන්නටත් සිදුවිය.

## පර්යේෂණ ප්‍රතිඵල

ඉහත සඳහන් කරන ලද අධ්‍යයන ක්‍රමවේද උපයෝගි කරගනිමින් සිදුකරන ලද පර්යේෂණයෙන් නිගමන කිහිපයකට එළඹීමට හැකිවිය. ඒ අනුව ත්‍රිපිටකයේ විනය හා සූත්‍ර පිටකවල ආරාමික ස්වස්ථතාවට අදාළ වාස්තු විද්‍යාත්මක අංග රාශියක් පිළිබඳ ව කරුණු අන්තර්ගත වන බව අනාවරණය කරගන්නා ලදී. එසේ අනාවරණය කරගන්නා ලද වාස්තු විද්‍යාත්මක අංග අතර ජන්තාඝරය, සක්මන්මළුව, මුළුතැන්ගෙය, වැසිකිළිය, කැසිකිළිය, ළිං හා පොකුණු ආදිය වේ. එම අංග ලංකාවේ මුල්කාලයේ දී ඒ ආකාරයෙන් භාවිත කළේද යන්න පිළිබඳ ව සෙවීමේදී පැහැදිලි වූයේ මුල්කාලීන ලාංකේය වාස්තු විද්‍යාඥයින් හැකිතරම් විනයානුකූල ලෙස එම ඉදිකිරීම් ඉදිරිපත් කිරීමට උත්සහකර ඇති බවය. එසේ වුවත් සෑම ඉදිකිරීමක් ම පාරිසරික සාධකවලට අනුකූල වන ලෙස නිර්මාණය කර ඇති බවත් දේශීය අනන්‍යතාවක් ගොඩනගා ඇති බවත් ඇතැම් අවස්ථාවල දී ඒවායෙහි භාවිතය විනය පිටකයට වඩා වෙනස් ආකාරයක් ගෙනඇති බවත් පැහැදිලි වේ.